**නාවිතන්වේලි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට නාවිතන්වේලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ලැබිය යුතු ගිණුම්**
**----------------------**

2001 වර්ෂයට පෙර ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.42,669 ක හිඟ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

**1.3.2 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**
**-----------------------------------------------------**

1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතින්වල I පරිච්ඡේදයේ 5 (xii) වන රීතිය ප්‍රකාරව, මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම යනාදී රාජකාරීමය වශයෙන් පවරා තිබුණු නිලධාරීන් තිදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.4,623,162 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,870,870 ක් ව තිබූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,752,292 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**
**----------------------**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
**-------------------------------------**

2016 දෙසැම්බර් 31 දිනට රු.2,469,982 ක මස්කඩ බදු කුලී හිඟ මුදල වර්ෂ 05 කට අධික කාලයක් දක්වා පැරණි ශේෂයක් වී තිබුණද එය 2017 ජුලි 12 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

**2.2.2 වරිපනම් හා බදු**

**-------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ස්ථානවල ඇති ව්‍යාපාර ආයතන 324 ක් සහ නිවාස 6,049 ක් මත 2003 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් රු.3,186,500 ක ආදායමක් අහිමි කරගැනීමට සිදු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------------**

පළාතට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර (PSDG) යටතේ 2016 වර්ෂයේදී ජනශූන්‍ය ප්‍රදේශයක ඉදිකරනු ලැබූ වටිනාකම රු.990,016 ක් වූ විවෘත වෙළඳපොළ 2017 ජුලි 12 දින වන විටත් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**-------------------------------**

පළාතට වෙන්කරනු ලැබූ වැඩසටහනක් යටතේ රු.498,117 ක වියදමින් මධ්‍යම කඳවුර ක්‍රීඩා පිට්ටනිය අළුත්වැඩියා කර තිබූ නමුත් එම පිට්ටනිය සඳහා මිනුම් අනුව යොදා තිබූ පළමු තත්ත්වයේ (quality) බොරළු යෙදීම වෙනුවට තත්ත්වයෙන් බාල බොරළු යෙදීම නිසා කොන්ත්‍රාත්කරුවන්ට රු.34,414 ක් වැඩියෙන් ගෙවා තිබූ අතර ක්‍රීඩා පිට්ටනිය භාවිතා කළ නොහැකි ආකාරයෙන් විශාල ප්‍රමාණයක කුඩා ගල් කැට මතු වී තිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය**

**-----------------------------**

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ජනතාව අතරේ බෙදාහැරීම සඳහා රු.14,985 ක වටිනාකමට අත් පත්‍රිකා 2,000 ක් සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණය කර තිබූ නමුත් 2017 ජුලි 12 දින වන විට එයින් අත් පත්‍රිකා 1,200 ක් බෙදා නොහැර තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 නිරවුල් නොවූ විගණන ඡේද**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එවකට උතුරු නැගෙනහිර පළාත් සභාවෙන් වැටුප් ගෙවීමේ අරමුණින් 2006 දෙසැම්බර් 18 දී ලබා දී තිබූ රු.71,600 ක් වටිනා චෙක්පත බැංකුවේ තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවීම හේතුවෙන් මේ දක්වා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ රු.මිලියන 3 ක පිරිවැයකින් ඉදිකරනු ලැබූ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය, කෝවිලට ආසන්නයේ පිහිටා තිබීම නිසා මහජනතාවගේ විරෝධතා හේතුවෙන් 2017 ජුලි 12 දින වන විටත් භාවිතා නොකර නිෂ්කාර්යව පැවැති අතර එහි පැවැති භාණ්ඩ සොරාගෙන තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| **පාලන ක්ෂේත්‍රය** | | **අවධානය යොමු කළ යුතු කරුණු** |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | කොන්ත්‍රාත් කළමනාකරණය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර කොන්ත්‍රාත් ලබාදීම. |
| (ඇ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |